කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2014/15

2019 පෙබරවාරි - අප්‍රේල්

සමාජීයවිද්‍යා පීඨය

# මනෝවිද්‍යාව

## සමාජ චර්යාව පිළිබඳ මනෝවිද්‍යාව PSYC - E 3015

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. සමාජ චර්යාවක ස්වභාවය හා ලක්ෂණ විස්තර කර එම චර්යා අධ්‍යයනයේ සමාජීය උපයෝගිතාව පෙන්වා දෙන්න.

02. "සමාජීය සංජානනය යනු "සමාජීය ලෝකය" (Social World) හඳුනාගැනීමේ ක්‍රියාවලියයි" මෙම ප්‍රකාශය සැලකිල්ලට ගනිමින් සමාජ සංජානනය සඳහා "අවාචික සන්නිවේදනය" (Non-verbal Communication ) යොදා ගැනෙන ආකාරය පැහැදිලි කරන්න.

03. "සමාජ අර්ථකථනය" (Social Interpretation) හා "සමාජ බලපෑම" (Social Influence) යන සංකල්ප අර්ථ දක්වා සමාජීය ජීවිතය තුළ එම සංකල්පයන්ගේ භූමිකාව පෙන්වා දෙන්න.

04. සමාජ ප්‍රජානනයේ (Social Cognition) මූලික ස්වරූපයන් දක්වා ඒවා තුළ මනෝරටා (Schemas) ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි කරන්න.

05. "ආකල්පයක් " (Attitude) නිර්මාණය වන්නේ කෙසේද? න්‍යායාත්මකව පැහැදිලි කරන්න.

06. පුද්ගලයා "පූර්ව විනිශ්චය" (Prejudice) සහ "වෙන්කොට සැලකීම" (Discrimination) කෙරෙහි යොමුවීමෙහිලා බලපාන සාධක සමාලෝචනය කරන්න.

07. "පරාර්ථකාමී හැසිරීම්" (Prosocial Behaviours) කෙරෙහි යොමුවීමේ හේතු ඇතුළත් ලැයිස්තුවක් සකසා එම චර්යා වර්ධනය කළහැකි ක්‍රමෝපායයන් යෝජනා කරන්න.

08. කණ්ඩායමක් (Group) තුළ අන්තර්ගත ලක්ෂණ මොනවාදැයි විස්තර කර පුද්ගලයා කෙරෙහි කණ්ඩායමක් බලපාන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

***********************************